බලංගොඩ නගර සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්ථාව 2017 අගෝස්තු 17 දින සභාවේ ලේකම්වරියට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බැලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය ලේඛනය අනුව රු. 6,457,948 ක් වූ සේවක ණය රු. 5,008,370 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සේවක ණය රු. 1,449,578 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) 2017 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු. 78,310 ක් වූ පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් පුස්තකාල පොත් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති උපලේඛණය අනුව රු. 15,751,210 ක් වු ලැබිය යුතු ප්‍රාග්ධන ලැබීම් රු.16,364,834 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ලැබීම් රු. 613,624 ක් වැඩියෙන් දැක්වුණි.

(ඈ) නගර සභාවට අයත් ආයුර්වේද මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂය ආරම්භයේ වූ රු. 305,704 ක් වූ තොගය සහ රු. 697,620 ක් වූ අවසන් තොගය ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව ඉවත් කරන ලද රු. 18,966 ක් වූ පුස්තකාල පොත් ගිණුම් වලින් ගලපා නොතිබුණි.

(ඊ) වරිපනම් බදු ලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් රු. 3,776,898 ක් වුවද රු. 3,530,947 ක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් ලැබිය යුතු වරිපනම් රු. 245,951 ක් අඩුවෙන් දැක්වුණි.

(උ) බස් නැවතුම්පළ ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂ සනාථ කිරීම අනුව රු. 82,088,845 ක් වූ ගෙවිය යුතු පොළිය රු. 53,263,555 ක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් ගෙවිය යුතු පොළිය රු. 28,825,290 ක් අඩුවෙන් දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 99,505 ක් වූ පුස්තකාල පොත් ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ආදායම් ණය ගැතියන් 108 ක ගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයකර ගතයුතු එකතුව රු. 1,202,654 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 139,100 ක් වූ කඩ කාමර කුලී 2017 ජූනි 19 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ වලට අදාල එකතුව රු. 763,360 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 9,303,601ක් වූ මුදල් මාරු ගිණුමේ ශේෂය 2017 ජූනි 19 දින වන විටත් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම් විෂයයන් 05 ක් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන හා අනෙකුත් ගිණුම් විෂයයන් 02 ක් සනාථ කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.4 නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ 137 | සේවාවන්, වැඩ හෝ සැපයුම් සඳහා ගෙවීමට පෙර සභාවේ ලේකම් විසින් අනුමත කලයුතු නමුත් එකතුව රු. 80,480 ක් වූ වවුචර් 06 ක් අනුමත කර නොතිබුණි. |
| (ii) මු.රෙ 260 (1) | නියමිත තැනැත්තාට මුදල් ගෙවීමට කටයුතු කලයුතු නමුත් ඊට පටහැනිව සෞඛ්‍ය අංශයේ සේවකයන් 08 දෙනෙකු වෙනුවෙන් උත්සව අත්තිකාරම් ලෙස ගෙවන ලද රු. 80,000 ක් එක් එක් සේවකයන්ට වෙන වෙනම නොගෙවා වෙනත් ආදායකයෙකුට ගෙවා තිබුණි. |
| (iii) මු.රෙ 267(1) | 2016 වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල නිලධාරීන් 74 දෙනෙකුට වැටුප් ගෙවීමේදී පඩි සටහන් පත්‍රයෙහි අත්සන් ලබාගෙන නොතිබුණි. |
| (iv) මු.රෙ 371(5) | 2010 වර්ෂයට පෙර සිට හඳුනා ගත නොහැකි ඉදිරියට ගෙන එනු ලැබූ නොපියවූ අත්තිකාරම් රු. 34,110,665 ක් හා සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද |

| | | |
|---|---|---|
| | | එකතුව රු. 177,000 ක අතුරු අග්‍රිම 03 ක් 2017 ජූනි වනවිටත් පියවා නොතිබුණි. |
| (v) | මු.රෙ 1646 | සභාවට අයත් වාහන 26 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් පොතේ මාසික සාරාංශය පිළියෙල කර නොතිබුණි. |
| (vi) | මු.රෙ 1647 (ඉ) | සභාවේ ඇති මෝටර් වාහන පිළිබඳව අදාල විස්තර ඇතුලත් වාහන ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.6 වගන්තිය | නිල නිවාස 05 ක මාසික ආර්ථික කුලිය රු. 1,000 සිට රු. 2,000 දක්වා තක්සේරු කර තිබුණද, සභා තීරණයකට අනුව රු. 1,500 ක මාසික කුලියක් අය කිරීමට කටයුතු කර තිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාවට අයත් රථවාහන 15 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවන් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 1,888,420 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 7,875,002 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5, 986,582 ක පහත වැටීමක් දක්නට ලැබුණි. 2016 වර්ෂයේ ජූනි මස සිට නගර සභා තානායම වසා දැමීම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 ජනවාරි සිට 2015 මැයි දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 3,216,410 ක් සහ 2015 ජුනි සිට 2016 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2017 ජූනි වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2016 ජූලි සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ අයවිය යුතු රු. 206,161 ක් වූ උසාවි දඩ මුදල් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2017 ජූනි වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් ගාස්තු රු. 2,105,153 ක් අයකර ගැනීමට 2017 ජූනි වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නීති විරෝධී ලෙස මත්පැන් අලෙවි කිරීම

2016 මැයි 21 වෙනි වෙසක් පුර පසලොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව සභාවට අයත් බලංගොඩ තානායමේ තබා ගැනීම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින රු. 1,515,000 ක දඩ මුදලක් සභාවට නියම කර තිබුණි. එම දඩ මුදල වාරික 9 කින් ගෙවීමට ඇති කර ගත් එකගත්වය අනුව 2017 ජූනි 19 දින වන විට වාරික 04 කින් රු. 793,571 ක් ගෙවා තිබුණි. මෙම සිද්ධියට සම්බන්ධ නිළධාරීන්ගෙන් අදාල දඩ මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් බලංගොඩ දිසා අධිකරණයේ නඩුවක් සභාව විසින් ගොනුකර තිබුණි.

(ආ) කඩකාමර අතුරු බදු දීම

----------------------------

බස් නැවතුම්පළ කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුම් වල 2.5 වගන්තිය ප්‍රකාරව බදුකරු විසින් එකී කඩකාමර හෝ එහි යම් කොටසක බුක්තිය වෙනත් අයෙකුට විකිණීම, පැවරීම හෝ අතුරු බද්දට දීම නොකළ යුතු වුවද, ඊට පටහැනිව එකතුව රු. 10,100 ක මාසික බදු කුලියකට බදු දෙන ලද කඩකාමර 02 ක් එකතුව රු. 35,000 ක මුදලකට අතුරු බදුදී තිබුණි. තවද මහජන පොලෙහි කඩකාමර බදුදීම සඳහා වූ ගිවිසුමේ 34 වන වගන්තියට පටහැනිව ගිවිසුම්ගත බදුකරුවන් විසින් කඩකාමර 07 ක් අතුරු බදු දී තිබුණද ඒ සම්බන්ධයෙන් 2017 ජූනි වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) බදු දුන් කඩ කාමර පුළුල් කිරීම.

-----------------------------------

බදු ගිවිසුම් වලට පටහැනිව බදු කරුවන් විසින් අතුරු බදු දුන් කඩ කාමර 06 ක් අවසරයකින් තොරව පුළුල් කිරීම හා කඩ කාමර වල භෞතික ස්වභාවය වෙනස් කිරීම සිදු කර තිබුණද, ඒ සම්බන්ධයෙන් 2017 ජූනි වනවිටත් ක්‍රියාකර නොතිබුණි.

(ඈ) බලංගොඩ මහජන පොලේ මාළු අලෙවි කිරීම

---------------------------------------------------

බලංගොඩ මහජන පොලේ පොදු වැසිකිලිය මැදට වන පරිදි වැසිකිලියට දෙපැත්තෙන් හා ඊට යාබදව ඉදිකරන ලද කඩ කාමර 03 ක් ගබඩා ලෙස භාවිතා කිරීම සඳහා නගර සභාව විසින් ගිවිසුම් අත්සන් කර තිබුණද, ගිවිසුමට පටහැනිව එම කඩ කාමර මාළු අලෙවි කිරීම සඳහා යොදාගෙන තිබුණි.

(ඉ) නගර සභා සීමාව තුල සංරක්ෂිත පරිසර කළාප ආරක්ෂා කිරීම

-------------------------------------------------------------------

අංක 1868/8 සහ 2014 ජූනි 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1982 අංක 04 නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධන) පනතේ 8 (ඊ) වගන්තියට අනුව නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බලංගොඩ නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මෙහි 4.3.5 වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ ජල මාර්ග තුනක් සහ කුඹුරු ඉඩම් 34 ක් සංරක්ෂිත පරිසර කළාප ලෙස 2014 වර්ෂයේ දී නම් කර තිබුණි. මෙම සංරක්ෂිත පරිසර කළාප පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග 2016 නොවැම්බර් 07 දින වන විටත් ගෙන නොතිබීමෙන් මෙම

සංරක්ෂිත කලාප අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීමේ කාර්යයට බාධාවක් වී තිබුණු බව නිරීක්ෂණය විය.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු. 24,928,666 ක් වූ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය 2015 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) සභාවේ මහජන පොළට අදාල අතුරු ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය අනුව මහජන පොළ තුල මාළු අලෙවි කිරීම සඳහා අවසර නොමැති වුවද, ඊට පටහැනිව මහජන පොළ භූමිය තුළ මාළු අලෙවි සැල් 10ක් ඉදිකර තිබූ අතර එයින් රු. 715,910 ක් වැයකර ඉදිකර තිබුණු අලෙවිසැල් 06 ක් 2014 ඔක්තෝබර් සිටද ඉතිරි අලෙවි සැල් 04 ඊට පෙර සිටද නිෂ්කාර්යව පවැතිනි.

3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්යය මණ්ඩලයේ ලේකම් තනතුර ඇතුළුව පුස්තකාලාධිපති තනතුරක්, ආදායම් පරීක්ෂක තනතුරු 02 ක්, ඖෂධ සංයෝජක තනතුරක් හා වැඩ කම්කරු තනතුරක් පුරප්පාඩුව පැවතුනි.

(ආ) 2016 මාර්තු 15 දින අංක DMS/D/0217 දරන කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ ලිපිය මගින් බලංගොඩ නගර සභාවේ ගිනිනිවීමේ ඒකකය සඳහා කාර්යමණ්ඩල තනතුරු 20 අනුමත කර තිබූ නමුත් එම තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීමෙන් ගිනි නිවීමේ ඒකකය විධිමත්ව ස්ථාපිත කිරීමට 2017 ජූනි වනවිටත් නොහැකි වී තිබුණි.

3.4 හඳුනාගත් අලාභ

ගබඩා ලෙජරයේ සටහන් කර තිබූ වටිනාකම රු. 7,760 ක් වූ පිත්තල මල් පෝච්චි 04 ක ඌනතාවයක් 2017 ජූනි 14 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

------------------------

බලංගොඩ නගර සභාවේ අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තු වටිනාකම රු. 3,3700,000 ක ප්‍රාග්ධන ව්‍යාපෘති 12 ක් 2016 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් අනුමැතිය නොලැබීම හේතුවෙන් 2017 ජූනි 19 දින දක්වා එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

----------------------------------

නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයට වාර්ෂිකව එකතුවන අපද්‍රව්‍ය වලින් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය දළ වශයෙන් ටොන් 504 ක් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ එක්රැස් වෙමින් තිබූ අතර එම අපද්‍රව්‍ය තොගය පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් 2017 ජූනි වන විටත් සභාව සකස්කර නොතිබුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව පුනරාවර්තන වියදම් ප්‍රතිපාදනය රු.මිලියන 123.12 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 109.67 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු.මිලියන 13.46 ක් හෙවත් සියයට 11 ක් ඉතිරි වී තිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 31.55 ක් වූ අතර එහි තත්‍ය වියදම රු.මිලියන 13.12 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු.මිලියන 18.43 ක් හෙවත් සියයට 58 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදවා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයේ 4.2.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතුකර නොතිබුණි.

05. පද්ධති හා පාලනයන්

-------------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (ii) | ආදායම් , වියදම් හා වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| | | (iii) | ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම |
| (ආ) | අයවැය පාලනය | (i) | වැය ප්‍රතිපාදනවල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | | (ii) | ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | | හිඟ ආදායම් අයකර නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | (i) | වාහන ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (ii) | වාහනවල ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීම |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම |